# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2142/17 - 2019 සැප්තැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2019.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම උපලේඛන I හි I වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ එම ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 10 වැනි දින,
17 හා 18 මහල්,
''සුහුරුපාය''
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය I**

***රත්තොට නාගරික සංවර්ධන බලප්‍රදේශය***

*I වන තීරුව*

අංක E 371 පල්ලේවේරගම, අංක E 371 C විහාරගම, අංක E 372 A ඉහළ ඕවල, අංක E 373 පල්ලේගම, අංක E 373 A කයිකාවෙල. අංක E 373 B මරඳුරාවල, අංක E 373 C ලොන්විල්, අංක E 376 රත්තොට, අංක E 376 B කුරුවාව, අංක E 377 නිකවෙල යන ග්‍රාම නිලධාරි වසම්වලට අයත් වන්නා වූ මෙහි II වන තීරුවේ විස්තර වන්නා වූ මායිම් සහ ඉම් වලින් සමන්විත මුළු මහත් භූමි ප්‍රමාණය ද වේ.

*II වන තීරුව*

උතුරට :

අංක E 379 A ක්ලෝඩා ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිමත්, අංක E 372 පහළ ඕවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඊසාන මායිමත්, අංක E 372 A ඉහළ ඕවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වයඹ මායිමත් ඡේදනය වන ලක්ෂ්‍යයෙන් පටන්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය I *(සම්බන්ධිතයි)*

*රත්තොට නාගරික සංවර්ධන බලප්‍රදේශය*

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| | ගෙන, එතැන් සිට අංක E 372 A ඉහළ ඕවල හා අංක E 373 A කයිකාවෙල යන ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්හි උතුරු මායිම් ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර, එතැන් සිට අංක E 377 නිකවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර හා උතුරු මායිම් ඔස්සේ දකුණ දෙසට ගමන් කර, එතැන් සිට අංක E 376 B කුරුවාව හා අංක E 376 රත්තොට ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්හි උතුරු මායිම් ඔස්සේ නැගෙනහිර දෙසට ගමන් කර, අංක E 378 දන්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ. |
| | *නැගෙනහිරට :*<br>අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක E 376 රත්තොට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර එතැන් සිට අංක E 373 C ලොන්විල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර, අංක E 376 A වෙලන්ගහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ. |
| | *දකුණට :*<br>අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක E 373 C ලොන්විල්, අංක E 373 B මරදූරාවල, අංක E 373 පල්ලේගම, අංක E 373 A කයිකාවෙල යන ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්හි දකුණු මායිම් ඔස්සේ බටහිර දෙසට ගමන් කර, එතැන් සිට අංක E 372 A ඉහල ඕවල, අංක E 371 පල්ලේවේරගම, අංක E 371 C විහාරගම යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවල බටහිර මායිම් ඔස්සේ දකුණු දෙසට ගමන් කර, එතැන් සිට අංක E 371 C විහාරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර, අංක E 352 H ඔය පහළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඊසාන මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ. |
| | *බටහිරට :*<br>අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක E 371 C විහාරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර, එතැන් සිට අංක E 371 C විහාරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර, එතැන් සිට අංක E 371 පල්ලේ වේරගම හා අංක E 372 A ඉහළ ඕවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයන්හි බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර, ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ. |

10 - 267

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.